www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බීපී තෙල් කාන්දුව සහ පෞද්ගලික හිමිකාරත්වයේ කෲරත්වය

**The BP oil spill and the tyranny of private ownership**

2010 ජූනි 11

එක්සත් ජනපද ඉතිහාසයේ අතිශයින්ම විනාශකාරී පාරිසරික ව්‍යසනයෙන් පනස් එක්වන දිනයේදී වොෂිංටනය ඒ හැටියට ගත් තම පරිශ්‍රමය දෙගුන කරමින් සිටින්නේ, ගල්ෆ් තෙල් කාන්දුව අවහිරකිරීම පිලිබඳව නොව, බීපීයට මෙන්ම සමස්තයක් වසයෙන් තෙල් කර්මාන්තයටම එයින් මතුකර තිබෙන මූල්‍යමය අනතුරු වලක්වා ගැනීමටය.

සමාගමේ ගෙවීම් පැහරහැරීම පිලිබඳ බැඳුම්කර රක්ෂනය කිරීමේ වියදම ඉහල යාමත් සමග ම බීපී සමාගමේ කොටස් අගය තෙල් කාන්දුවට පූර්වයෙන් පැවති වටිනාකමට වඩා සියයට 40කින් පහත වැටුනු විට, 10 දින මාධ්‍ය අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කලේය. විශ්ලේෂකයන්ට අනුව සමාගම, ඉදිරියේදී ගෙවීමට නියමිත ඩොලර් බිලියන 10කට අධික බෝනස් අත්හිටුවීමට යන්නේය යන ආරංචි පැතිරයාමත් සමග වෙලඳපොලවල් ඊට දඬුවම් දුන්නේය.

තෙල් කාන්දුව හේතුවෙන් තමන්ගේ ජීවිකා වෘත්තීන් අහිමි වී සිටින ගල්ෆ් වෙරල තීරයේ මිනිසුන්ට වන්දි මුදල් ගෙවීම යෝධ තෙල් සමාගම විසින් අත්හිටුවා හා පමා කරමින් තිබියදී පවා, සිය කොටස්හිමින්ට බෝනස් ගෙවීමට බීපීයට ඇති "අයිතිය" හා "වගකීම" සහතික කිරීම පිනිස බ්‍රිතාන්‍ය මූල්‍ය මාධ්‍යයන් පූර්න මෙහෙයුමක් දියත් කලේය. බීපීයට එරෙහි වොෂිංටනයේ "පිලිගත නොහැකි" පුරාජේරු පිලිබඳව බ්‍රිතාන්‍ය කර්මාන්තයේ "චකිතය" ගැන 10 දින ලංඩනයේ *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ ප්‍රධාන ලිපියෙන් වාර්තා කලේය.

මෙය පිලිබිඹු කරන්නේ, වෝල්වීදිය හා එක්සත් ජනපදයේ යෝධ තෙල් සමාගම් බ්‍රිතාන්‍ය-පදනම් කරගත් සමාගම පරයා තරගකාරී වාසි ඩැහැගැනීමටත් වෙලඳපොලේ විශාල කොටස් ප්‍රමානයක් ඩැහැ ගැනීමටත් ගල්ෆ්හි විනාශය යොදා ගනු ඇතැයි පලවූ භීතියයි. සත්තකින්ම, මූල්‍ය උපාමාරු යොදාගැනීමේ මාධ්‍ය තුලින් බිලියන ගනනක් වියහැකි කාන්දුවේ පිරිපහදු වියදම් හා දඩ ගෙවීම් වලින් බීපී සමාගමේ බැංකු, ප්‍රධාන කොටස් හිමියන් හා බැඳුම්කර හිමියන් ආරක්ෂා කිරීමේ කුමන්ත්‍රනය දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබේ. අවසාන වශයෙන් මෙම බර පටවනවා ඇත්තේ ජනතාවගේ කර මතය.

බීපීය බංකොලොත්තුවට යැවීම හෝ එය එක්සත් ජනපදය පදනම් කරගත් එක්ස්සොන් මොබිල් වැනි ප්‍රතිමල්ලව සමාගමක් භාරයට ගැනීමට අදාල එවැනි එක් ජවනිකාවක් ගැන *නිව්යෝර්ක් ටයිම්ස්* මූල්‍ය තීරු රචක ඇන්ඩෲ රොස් සෝර්කින් මෑතදී විස්තර කලේය.

ඔහු මෙසේ ලිවීය: "විශේෂයෙන්ම, තෙල් කාන්දුවේ වගකීම්වලින් බීපී සමාගමට බේරී යාහැකිවන පරිදි ඇතිකරන ඒකාබද්ධ කිරීමක කොටසක් වසයෙන් එය යම් දිනකදී බංකොලොත්බව ඉල්ලා සිටිනු ඇතැයි යන අදහස වෝල් වීදිය තුල පැතිරෙමින් තිබේ. බැංකුකරුවෝ හා නීතිඥයෝ දැනටමත් සලසා ගත හැකි ගනුදෙනු අවස්ථා සලකා බලමින් සිටිති. ඔවුහු තමන්ට ලැබිය හැකි ගාස්තු පිලිබඳ ගනන් බලමින් සිටිති."

"ෂෙල් හා එක්ස්සොන් මොබිල් යන සමාගම් දෙකම තමන්ගේ පංගුව පිලිබඳව තලුමරමින් සිටින බව කියැවේ. ගිනි කන නීතිඥ මනසිකත්වය දැනටමත් සිහින මවන්නේ, බීපීය බංකොලොත්කමේ පූර්වගොනුකිරීම සිදුකලහැකි බවට හා පවිත්‍රකිරීමේ පිරිවැය තම වගකීමෙන් වෙන්කර වෙනත් ව්‍යාපාරයක් වෙත මාරුකරනු ඇති බවටත් ය. නීති ගාස්තු වශයෙන් ඩොලර් බිලියන ගනනක් ගැන ඔවුහු ගනන් බලති.

බීපීය ස්වාධීන ව්‍යාපාරයක් ලෙස පන ගැට ගසා ගන්නේද නැතිනම් එහි ඉහල කොටස්කරුවන් හා නය කරුවන් එක්ස්සොන් හෝ ෂෙල් සමාගම්වල රැකවරනය ලබන්නේද යන්න කෙරෙහි ඇමෙරිකානු පාලක පන්තියට ඇත්තේ සමස්තයක් ලෙස තෙල් කර්මාන්තයම සුරක්ෂිත කරගැනීමට වඩා මඳ සැලකිල්ලකි. සකල අරමුනු හා කාරනා අතින් තමන්ගෙන් දීමනා ලබන තෝරා පත්කරගත් දේශපාලඥයින් හරහා ක්‍රියාත්මක වෙමින්, තෙල් කර්මාන්ත කරුවෝ සිය කටයුතු මත කෙරෙන තාවකාලික හෝ පාර්ශවීය කුමන හෝ අවහිර කිරීමක් නවතා දැමීමට බලකරමින් සිටිති.

පසුගිය සතියේදී, මෙක්සිකෝ බොක්කේ ගැඹුරු මුහුදු පතුලෙහි නව කැනීම් සඳහා අනුමැතිය පලකිරීම සය මසකට අත්හිටුවීම පිලිබඳ ජනාධිපති ඔබාමාගේ තීන්දුව, රැකියා සුරක්ෂිත කිරීමක් යයි නරුම ලෙස වෙස්ගැන්වූ කාර්මික මෙහෙයුමක එල්ලය වී ඇත.

තෙල් කර්මාන්තයේ ප්‍රමුඛ "වත්කමක්" ලෙස සලකන ලුවිසියානා ප්‍රාන්තයේ ඩිමොක්‍රටික් සෙනෙට් සභික මේරි ලැන්ඩ්‍රියෝ 09 දින රැස්වූ සෙනෙට් බලශක්ති හා ස්වාභාවික සම්පත් කමිටු සාක්ෂි විමසුමේදී, වාරන කාලය ඉවත් කරන ලෙස අභ්‍යන්තර ලේකම් කෙන් සලසාර්ට බලකර සිටි අතර "මාස කීපයකට වඩා බලපැවත්වුවහොත් එය බීපී තෙල් කාන්දුව මඟින් ඇති කල විනාශයට වැඩි හානියක් මෙම කලාපය තුල ආර්ථිකයට ඇති කරනු ඇත" යනුවෙන් විකාර ප්‍රකාශයක් කලාය.

ගැඹුරු මුහුදේ කැනීම් කටයුතු මත සම්පූර්න තහනමක් ලෙස මාධ්‍ය විසින් සාවද්‍ය ලෙස හඳුන්වා දෙන මෙම සය මසක කෙටි වාරනය, ඇත්ත වසයෙන්ම බලපාන්නේ දැනට ක්‍රියාත්මකව ඇති ව්‍යාපෘතීන්ට නොව තවමත් වැඩ අරඹා නැති නව කැනීම් ව්‍යාපෘති 33කට පමනි. ඔබාමාගේ සංකේතාත්මක පියවර නිසා රැකියා අහිමිවීමේ ප්‍රතිපලය කුමක් වුවත් එය, කිසිදිනෙක පෙර තත්වයට ඒමට හැකි නොවන ලක්ෂ ගනනක් විය හැකි කලාපයේ ධීවර හා සංචාරක කර්මාන්තයේ ජීවනෝපායන් අහිමිවීම හමුවේ අඟුටු මිටි තත්වයක් වනු ඇත.

ඊට ප්‍රතිචාර දක්වමින් සලසාර් කියා සිටියේ, තෙල් කාන්දුව පිලිබඳව විමර්ශනය කිරීම සඳහා ඔබාමා විසින් පත් කල කොමිටියට සාගර පත්ලේ නව කැනීම් ව්‍යාපෘති නවතා දැමීමේ අදහසක් නොමැති බවයි. එහි අරමුන "විරාම බොත්තම එබීම මිස. . . නැවතීමේ බොත්තම එබීම නොවේ," එය විරාම බොත්තම වන බැවින් අපට මහාද්වීපයෙන් එපිට තට්ටුවේ කැනීම් කටයුතු සමගින් පෙරට යා හැකි බවට සහතික විය හැකිය. එමෙන්ම එය ජනතාවගේ සුරක්ෂිතතාව හා පරිසරයේ සුරක්ෂිතතාව ඇතිකරන ආකාරයකින් සිදුකල හැකිය," සලසාර් පැවසීය.

මාස තුනක හෝ හයක විමර්ශන කාලයකින් පසුව ගැඹුරු සාගර පත්ලේ කැනීම් කටයුතු ආරක්ෂිතව ගෙනයාමේ ක්‍රියාමාර්ගයන් ගනු ඇතැයි යන කියාපෑමේ විශ්වාසනීයත්වය, විශේෂයෙන්ම ඔබාමාගේ නිරීක්ෂන මන්ඩලයේ සම-සභාපතිවරුන්ගෙන් එක් අයෙකු කොන්කොපිලිප්ස් තෙල් සමාගමේ අධ්‍යක්ෂ මන්ඩලයේ වාඩිවී සිටින තත්වය හමුවේ නැතිව ගොස් තිබේ.

තෙල් කාන්දුවේ සමස්ත අත්දැකීම ම පැහැදිලි කර ඇත්තේ, ධවල මන්දිරයේ සිට කොන්ග්‍රසය, ප්‍රාන්ත ආන්ඩු හා පලාත් ආන්ඩු තෙක් සෑම මට්ටමකදීම ඒවා, මහා ව්‍යාපාරිකයන්ට යටත් බව හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් තර්ජනයට ලක්වන කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට එම ආයතන අපොහොසත් වන බවය.

එක් පැත්තකින් රැකියා සැපයීමත් අනෙක් පැත්තෙන් ආරක්ෂාව හා පාරිසරික උත්සුකතාවන් සලකා බැලීමත්, පෑහිය නොහැකි ප්‍රතිවිරෝධතාවන් දෙකකි යන කියාපෑම, පාලක පන්තියේ පැරැනි උපායකි. තව තවත් රැකියා නැතිවන්නේ යයි වෙහෙසට පත් කම්කරුවන් බියගන්වන අතර තෙල් කර්මාන්තකරුවන් හා ඔවුන්ගේ දේශපාලඥයින් තමන්ගේ කොන්දේසිවලට පදනම දමාගනිතිඃ කැනීම අත්හිටුවීමෙන් තෙල් කම්කරුවන්ට සිය රැකියා අත්හැර දැමීමට නැත්නම් කැනීම් යලි ඇරඹීම හා තවත් විනාශයක අනතුරට මුහුනපෑම වශයෙනි.

මෙය, තෙල් කර්මාන්තයේ පාලනය හා හිමිකාරීත්වය පෞද්ගලික අයිතියේ තබා ගත යුතුය සහ බලශක්තිය බෙදාහැරීම පෞද්ගලික ලාභයට යටත්කල යුතුය යන උප කල්පනය මත පදනම් කල සාවද්‍ය තෝරා ගැනීමකි. සත්‍ය වසයෙන් ම ඒවා අන්‍යෝන්‍ය වසයෙන් නොපෑහිය හැකිවූයේ වුවත්

රැකියා සුරක්ෂිතභාවය හා ගල්ෆ් මුහුදේ පාරිසරික සුරක්ෂිතතාව කරා එලැඹීමේදී තෙල් කර්මාන්තයේ ධනේශ්වර ස්වාමිත්වයේ තකතිරුභාවය හා විනාශකාරීබව සලකුනු කරයි.

තෙල්, මත්ස්‍ය හා සංචාරක යන කර්මාන්ත ක්ෂේත්‍රවල මෙන්ම නොනිගිනියහැකි කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාරවල රැකියා බේරාගැනීම සහ පරිසරය සුරක්ෂිත කරගැනීම සඳහා එකම පදනම බලශක්ති කර්මාන්තයේ පෞද්ගලික අයිතිය අවසන් කිරීමයි. වත්මන් විනාශය, මෙතරම්ම ස්වාධීන හා අන්තර් රඳපැවැත්මක් සහිත නූතන ජන සමාජයත්, තුනී ප්‍රභූ පැලැන්තයක් පෝෂනය කිරීම මත පදනම් වූ යල් පිනූ ආර්ථික පද්ධතියත් අතර නොපෑහීම ඉස්මතු කර දක්වයි.

බීපීයේ සාපරාධී නොතකා හැරීම මගින් බුන්වත් වූ අයට මුලුමනින්ම සහන සැලසීම ද රැකියා සම්පාදනය ද සිදුකරන අතරතුර, ගල්ෆ් මුහුදු තීරය පිරිසිදු කිරීමට අත්‍යවශ්‍ය සම්පත් ඒකාරාශී කරගැනීමේ මාවත වන්නේ, සමාගමේ ප්‍රමුඛ විධායක නිලධාරීන්ගේ හා මහා අයෝජකයින්ගේ පෞද්ගලික වාසනාව සැලසීම නොව, බීපී සතු වත්කම් හා සම්පත් අත්කර ගැනීම මගින් සමාජයේ යහපත සඳහා ඒවා යොදාගැනීම ය.

මෙය, බලශක්ති කර්මාන්තය ජනසතු කරන හා මහජන උපයෝගිතාවක් බවට ඒවා පරිවර්තනය කරන ක්‍රියාමාර්ගයක කොටසක් විය යුතු අතර වැඩ කරන ජනයාගේ ප්‍රජාතාන්ත්‍රික පාලනය යටතේ එය කල යුතුය. මෙම සමාජවාදී විසඳුම ලඟාකරගත හැක්කේ ඔබාමා පාලන තන්ත්‍රයට හා මහා ව්‍යාපාරිකයින්ගේ පක්ෂ දෙකට එරෙහිව වැඩ කරන ජනයාගේ දේශපාලන අරගලයක් තුල කම්කරුවන්ගේ ආන්ඩුවක් සඳහා සටන් වැදීමෙන් පමනි.

ගල්ෆ් තෙල් කාන්දුවට ප්‍රතිචාර දැක්වීමේ කර්තව්‍යය බීපී හා ඔබාමා පාලානාධිකාරියෙන් ඉවතට ගත යුතුය. තෙල් කාන්දුව තක්සේරු කිරීමට සහ ඔබාමා ප්‍රකාශ කරන ලෙස රැකියා විසි දහසක් නොව විධිමත් පුහුනුවක්, ආරක්ෂන අංගෝපාංග හා යහපත් වැටුප් හා දීමනාවන්ද සලසන රැකියා ලක්ෂ ගනනක් ස්ථාපිත කරන යෝධ පිරිසිදු කිරීමේ මෙහෙයුමක නායකත්වය ගැනීමට විද්‍යාඥයින් හා ඉංජිනේරුවන්ගෙන් සමන්විත ස්වාධීන කොමිසමකට අබාධිත ප්‍රවේශයක් සලසා දිය යුතුය.

ටොම් එලී

© www.wsws.org